**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතයේ 3.7 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන්ගිණුමෙන් නිවැරදි කරන බව | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ප්‍රමියේ 3.27 වගන්තියේ සිට 3.32 වගන්තිය දක්වා සඳහන් මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කළයුතු ක්‍රමවේදයට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.<br><br>• මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වර්ෂය සඳහා අතිරික්තය රු.52,741,814 ක් දැක්විම වෙනුවට වර්ෂයේ විස්තීර්ණ ආදායම රු.61,230,336 දක්වා තිබුණි.<br><br>• වර්ෂය තුල තොගයේ වැඩිවීම රු.494,706 මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දැක්විය යුතු වුවත්, එය මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.<br><br>• වර්ෂය තුල වෙනත් ජංගම වත්කම්වල වැඩිවීම රු.20,000 මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දැක්විය යුතු වුවත්, එය මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.<br><br>• වර්ෂය තුල ලැබිය යුතු දෑ වල අඩුවීම රු.29,634,929 ක් වුවත්, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එය රු.29,547,391 ක් ලෙස එනම් රු.87,538 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| • මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වර්ෂයේ ගෙවිය යුතු දෑ වල අඩුවීම රු.12,224,952 මුදල් ගලා යාමක් ලෙස දැක්විය යුතු වුවත්, එය මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.<br>• 2021 වර්ෂයේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කල රු.5.000,000 ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යෑමක් ලෙස දැක්විය යුතු වුවත්, එය මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.<br>• වර්ෂය තුල මුදලින් සිදු කල දේපළ , පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.19,945,890 ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යෑමක් ලෙස දැක්විය යුතු වුවත්, එය රු.39,029,165 ක මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.<br>• 2021 වර්ෂය තුල ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන රු.21,744,566 ක් වුවත් මුල්‍ය ක්‍රියාකාරකම් යටතේ එය රු.30,233,088 ක් ලෙස එනම් රු.8,488,522 ක් වැඩියෙන් දක්වා තිබුණි.<br>• වර්ෂය තුල දිගුකාලීන ණය ආපසු ගෙවීම් රු.5,197,871 මුල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යෑමක් ලෙස දැක්විය යුතු වුවත්, එය මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි. | 2022 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ප්‍රමිතයේ 6.3 පරිච්ඡේදය ප්‍රකාරව අස්තිත්වයක් විසින් ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව ගිණුම්ගත කළයුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දිනට රු.109,631,856 ක් වූ ඉඩම් වටිනාකම තුළ 2015 සිට 2019 වර්ෂය දක්වා ප්‍රාග්ධනිත කළ රු.108,631,860 ක් වූ ගොඩනැගිලි වටිනාකමක්ද ඇතුලත් කර තිබුණි. | නව තක්සේරුවෙන් පසු ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව ගලපන බව | |
| (ඈ)ප්‍රමිතයේ 6.10 පරිච්ඡේදය වත්කමක පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ අවශේෂ අගය අඩුකළ පසු ලැබෙන වටිනාකම මත ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමේදී වත්කම්වල අවශේෂ අගයන් ඇස්තමේන්තු කර නොතිබුණ අතර වත්කම්වල පිරිවැය මත පදනම්ව ක්ෂය ගැලපීම් කර තිබුණි. | 2022 වර්ෂයේ සුන්බුන් අගය අඩු කිරීමෙන් පසු ක්ෂය ගැලපුම් කරන බව | |
| (ඉ) ප්‍රමිතයේ 11.10 පරිච්ඡේදය ප්‍රකාරව අසම්භව්‍ය වගකීම් නිරවුල් කිරීමේදී සම්පත්වල ගලා යාමක් අපේක්ෂා කරන්නේ නම් එම අසම්භව්‍ය වගකීමේ ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය තුල පැවති නඩු 09 ක් සම්බන්ධයෙන් අසම්භව්‍ය වගකීමක් ලෙස හඳුනාගෙන මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | 2022 අවසන් ගිණුමට ගැලපීමට කටයුතු කරන බව | |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොඩනැගිලි ලේඛනය අනුව සභාවට අයත් ගොඩනැගිලි 29 ක් පැවතියද එම ගොඩනැගිලිවල සමස්ථ වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණ අතර මුල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි ලෙස 2020 හා 2021 වර්ෂයන්හිදී ප්‍රාග්ධනිත කළ වටිනාකම රු.13,012,411 ක් පමණක් දක්වා තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා නිවැරදි තක්සේරුවක් සිදුකළ පසු 2022 අවසන් ගිණුමෙන්ගැලපීම් කරන බව | ඉඩම් හා ගොඩනැගිලි විධිමත් තක්සේරුවක් කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ)දේපල, පිරියත හා උපකරණ ශේෂය තුල භෞතිකව හඳුනා ගන්නා ලද මිල්ලනිය ප්‍රාදේශිය සභාව සතු රු.12,213,571 ක් වූ දේපල, පිරියත හා උපකරණද ඇතුළත් කර තිබුණි. එම වත්කම් සඳහා 2021 වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය රු.1,025,512 ක් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි. | 2022 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදිව ක්ෂය වෙන් කරන බව | සභාව සතු සියළු ස්ථාවර වත්කම්ක්ෂය කළ යුතුය. |
| (ඇ) පෞද්ගලික ආයතනයක් හා බණ්ඩාරගම ප්‍රාදේශිය සභාව අතර 2017 සැප්තැම්බර් 19 දින ගිවිසුම්ගතව කාර්යාල කළමනාකරණය සඳහා මිලදී ගෙන තිබුණු රු.3,895,000 ක් වටිනා LGS පරිගණක මෘදුකාංගය දේපල,පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කරන බව | පරිගණක මෘදුකාංග වත්කමක් ලෙස ගිණුම්ගතකළ යුතුය. |
| (ඈ)2020 වර්ෂයේදී ලැබී තිබු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.84,885,223 න් එම ප්‍රාග්ධන ප්‍රදානය යෙදවූ වත්කමට අදාල ක්ෂය ප්‍රතිශතයන්ට සමාන වටිනාකමක් ආසන්න වශයෙන් රු.8,488,522 ක් සමාලෝචිත වර්ෂයේදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අයභාරය යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් ලෙස සටහන් කර නොතිබුණු බැවින් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) 2020 වර්ෂයේදී ලැබී තිබු රු.84,885,223 ක ප්‍රාග්ධන ප්‍රදානයෙන් සමාලෝචිත වර්ෂය තුලදී අයභාරය ලෙස හඳුනා ගනු ලබන අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම බැර කිරිම වෙනුවට සංචිත හා වෙන් කිරිම් ගිණුමට බැර කර තිබුණි.<br><br>(ඊ) 2021 වර්ෂයේදී ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.21,744,566 ක් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේද, සංචිත හා වෙන් කිරිම් ගිණුම යටතේද දෙවරක් සටහන් කර තිබුණි. | 2022 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ අතිරික්තයේ හෝ ඌණතාවයේ හඳුනාගත් හා හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදානවලට අදාල ගැලපුම් සඳහා ජර්නල් සටහන් පිළියෙල කොට අදාළ ලෙජර් ගිණුම් තුළ සටහන් කළයුතු වුවත්, එසේ කර නොතිබුණි.<br><br>(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා වු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල අතිරික්තයේ හෝ ඌණතාවයේ හඳුනානොගත් ප්‍රාග්ධන ප්‍රදාන සහ සංචිත වෙන් කිරිම් ගිණුම් සඳහා සිදු කරන ලද ගැලපුම් සටහන් කර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සමස්ථ ස්කන්ධයේ වටිනාකම නිවැරදිව දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ)සභාව වෙත පවරාගෙන තිබූ වෙන්දේසි ඉඩම් කොටස් 02 කට අදාල වටිනාකම් සභාව සතු වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි. | 2022 අවසන් ගිණුමෙන් ගැලපීමට කටයුතු කරන බව | සභාව සතු සියළු වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 කට අදාලව මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අනුරූපී වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු.23,814,671 ක වෙනසක් විය. | ගිණුම්වල වෙනස්කම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදි ශේෂ ගිණුමට ඇතුළත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,741,814 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.41,933,126 ක් විය.

### 2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 ජනවාරි 01 දිනට වරිපනම් බදු හිඟය රු.3,913,522 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.2,251,840 ක් හෙවත් සියයට 58 ක් අයකර නොතිබුණි. | හිග ආදායම් අයකර ගනිමින් පවතින බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2019,2020 හා 2021 වර්ෂයන්ට අදාලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා තිබූ මුද්දර ගාස්තු උපලේඛන වලින් රු.34,459,994 ක් හා උසාවි දඩ උපලේඛන වලින් රු.1,006,966 ක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ලැබී නොතිබුණි. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ලැබී නැති බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බණ්ඩාරගම ප්‍රාදේශිය සභාවෙන් වෙනම ඒකකයක් ලෙස 2018 මාර්තු 20 දින මිල්ලනිය ප්‍රාදේශිය සභාව ස්ථාපිත කර තිබුණු අතර වත්කම් බෙදීමේ අනුපාතය සම්බන්ධයෙන් එකග නොවීම නිසා සංස්ථාපනය කර වසර 04 කට ආසන්න කාලයක් ගතවී ඇතත් සභා දෙක අතර වත්කම් බෙදීමක් සිදු කර නොතිබුණි. | බණ්ඩාරගම හා මිල්ලනිය70:30 අනුපාතයට වත්කම් බෙදීම සඳහා වන මහ සභා තීරණය පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති බව | වත්කම් බෙදීම කඩිනමින් සිදු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ප්‍රාදේශීය සභා අරමුදලින් රු.800,000 ක් යොදවා ප්‍රතිසංස්කරණය කරන ලද චන්ද්‍රසිරි අනුස්මරණ ශක්ති කායවර්ධන මධ්‍යස්ථානය 2012 පෙබරවාරි 15 දින ජනතා පරිහරණය සඳහා ලබාදී තිබුණු අතර එම ගොඩනැගිල්ල දීර්ඝ කාලයක් තිස්සේ පරිහරණය සඳහා යොදා නොගෙන යන්ත්‍රසුත්‍ර පරිහරණයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.එමෙන්ම 2021 වර්ෂය තුල කායවර්ධන පුහුණු කටයුතු සිදු කර නොතිබුණද කායවර්ධන මධ්‍යස්ථාන පුහුණුකරු වෙත රු.82,500 ක දීමනාවක් ගෙවා තිබුණි. | කෝවිඩ් වසංගතය හේතුවෙන් මැයි සිට ඔක්තෝබර් දක්වා පුහුණුවීමේ කටයුතු නවතා ඇති අතර යන්ත්‍ර සුත්‍ර ආරක්ෂිතව තබා ගැනීම සඳහා සේවාව සපයා ඇති බැවින් ගෙවීම් කර ඇති බව | කායවර්ධන මධ්‍යස්ථානය පුහුණුවීම් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර සභාව වෙත භාරදී තිබුණු සතිපොළ ගොඩනැගිල්ල වසර 02 කට වැඩි කාලයක සිට බදු දීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි. | කෝවිඩ් වසංගතය හේතුවෙන් බදු දීමටකටයුතු කර නොමැති බවත්, සතිපොළ නැවත ආරම්භ කිරිමට වෙළඳ ප්‍රජාවන් දැනුවත් කර ඇති බව | සතිපොළ බදුදීම සඳහා ක්‍රියා කළ යුතුය. |